**යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2020**

**------------------------------------------------**

## 1.1 තත්වාගණනය කල මතය

---------------------------

යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ (“විද්‍යායතනය”) හි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ෂවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිනිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකිබව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදි අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිනිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවෙන්නේ නම් මාගේ මතය විකරණය කළයුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැක.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- විද්‍යායතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව, සහ

- විද්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සැකසීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයේ යොමුව සමඟ අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 ප්‍රකාරව වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. රු. 31,034,308 ක් වටිනා දේපල පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 03 ට අනුකූලව ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඔබගේ අදහස අනුව අපි එය පිළිගෙන මේ සම්බන්ධයෙන් අපගේ ප්‍රධාන ආයතනයේ ප්‍රතිපත්තිය විමසා ඒ අනුව සුදුසු පියවර ගනිමු. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂ හතර සඳහා තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා රු. 1,679,755 ක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, | ඉදිරියේදී ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ නීතිවලට අනුකූල විය යුතුය. |

සමාලෝචිත වර්ෂය අවසානයේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන රු.1,679,755 කින් වැඩි වී ඇති අතර සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන රු.262,353 කින් වැඩි වී ඇත.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සිසුන්ගෙන් ලැබුණු රු. 68,000 ක ආපසු ගෙවිය හැකි පුස්තකාල තැන්පතු වසර 1 සිට වසර 2 දක්වා කාලය තුළ නොවිසඳී තිබූ අතර ඒවා පියවීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන ජංගම නොවන වගකීම් යටතේ පෙන්වා ඇත. | අපි ඔබගේ නිරීක්ෂණය පිළිගෙන වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමු. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ii) | රු. 246,175 ක චෙක්පත් වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා කාලය තුළ උපලබ්දි වී නොතිබූ අතර ඒවා උපලබ්දි කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන ජංගම නොවන වගකීම් යටතේ පෙන්වා ඇත. | ආදායම් ලදුපත් ගිණුමට මෙම වරද නිවැරදි කිරීමට පියවර ගන්නා අතර ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2018 අංක 19 දරන ජාතික විගණන පනත**<br>- වගන්තිය 40(1) | 2014 වර්ෂයේ විද්‍යායතනය ආරම්භයේ සිට අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | අපි අමාත්‍යාංශය හරහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන සේවක සංඛ්‍යාව ඉල්ලා සිටියේය. නමුත් මේ වනතුරු අපට අනුමැතිය ලැබී නොමැත. එබැවින් අභ්‍යන්තර විගණකවරයා සඳහා | අදාළ පනතේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුමත සේවක සංඛ්‍යාව ලැබෙන තුරු අපගේ කාර්ය මණ්ඩලයෙන් අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීමට අපි කටයුතු කර ඇත. | |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුල්‍ය රෙගුලාසි** | | | |
| (i) මුල්‍ය රෙගුලාසි 396 | රු. 125,296 ක් වටිනා චෙක්පත් 07 ක් මාස හයකට වැඩි කාලයක් බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, මුල්‍ය රෙගුලාසිවලට අනුව කළමනාකාරීත්වය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කාලය තුළ මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන අතර නියමිත කාලය තුළ වෙනස්කම් සිදු කිරීමට පියවර ගනු ඇත. | මුල්‍ය රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ii) මුල්‍ය රෙගුලාසි 507 | 2019 සහ 2020 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය ගෙන ඇත. කෙසේ වෙතත්, COVID 19 තත්ත්වය හේතුවෙන් එය අවසන් කිරීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර වැඩකටයුතු සිදුවෙමින් පවතී. | මුල්‍ය රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| **(ඇ) චක්‍රලේඛ** | | | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | | | |
| • 4.2.6 පරිච්ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා විද්‍යායතනයේ කාර්ය සාධන වාර්තාව කළමනාකරණ මණ්ඩලය විසින් විශ්ලේෂණාත්මකව | කාර්තුව අවසන් වී දින 30ක් ගතවීමට පෙර BOM මගින් විශ්ලේෂණාත්මකව සමාලෝචනය කර රාජ්‍ය ව්‍යවසාය | චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30ක් ගතවීමට පෙර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| • 9.2 පරිච්ඡේදය | සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සහකාර ලේඛකාධිකාරී, සහකාර මුල්‍යාධිකාරී සහ සහකාර පුස්තකාලයාධිපති යන තනතුරු සඳහා විද්‍යායතනය සේවකයින් 3 දෙනෙකු බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ට වැටුප් සහ දීමනා ලෙස රු.2,113,732 ක් ගෙවා තිබුණි. | ලේඛකාධිකාරී, මුල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපති සේවක ගණය පිළිවෙලින් සහකාර ලේඛකාධිකාරී, සහකාර මුල්‍යාධිකාරී සහ සහකාර පුස්තකාලයාධිපති ලෙස පරිවර්තනය කිරීම සඳහා දැනටමත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අයදුම්පත් ඉදිරිපත් කර ඇත. අපි ඔවුන්ගේ පිළිතුර බලාපොරොත්තුවෙන් සිටිමු. | චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ii) විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා මෙහෙයුම් අත්පොත | | | |
| - 2.4.1(ඌ) පරිච්ඡේදය | ව්‍යාපාරික අංශයේ ප්‍රධානියා විසින් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට මාසික ප්‍රගති වාර්තාවක් සකස් කර නොතිබුණි. | අපි ඔබගේ නිර්දේශය පිළිගෙන ඇති අතර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා මාසික වාර්තාවක් සකස් කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | විශ්වවිද්‍යාල විද්‍යායතනවල මෙහෙයුම් අත්පොතට අනුකූල විය යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවස්ථා නවයක දී ලියන ලද රු.142,402 ක චෙක්පත් මාස 3 සිට 9 දක්වා කාලය තුළ අදාළ ගෙවන්නන් වෙත ලබා දීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන අතේ තබාගෙන ඇත. | චෙක්පත් ලියා ඔවුන්ට නිකුත් කරන ලෙස දැනුම් දී ඇතත් අදාළ අයට නියමිත වේලාවට එය ලැබී නොමැත. මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවන අතර නිසි කලට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේදී විද්‍යායතනයේ මෙහෙයුම් හේතුවෙන් රු. 3,577,994 ක අතිරික්තයක් වූ අතර, ඊට පෙර වර්ෂයේ අනුරූප අතිරික්තය රු. 228,417 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,349,577ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ සමාලෝචිත වර්ෂය සඳහා වියදම් අඩු වීමයි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වසර 04 ක කාලය තුළ විද්‍යායතනයේ අධ්‍යාපනය ලැබූ සිසුන් 921 දෙනාගෙන් සිසුන් 69 කට සමාන සියයට 7 සිට 11 ක් අදාළ පාඨමාලා සම්පූර්ණ නොකර විද්‍යායතනයෙන් ඉවත්ව ගොස් ඇත. | අතහැර දැමීම රට පුරා ඇති වෘත්තීය පුහුණු ආයතන සහ විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා පොදු ප්‍රශ්නයක් වී ඇත. එය අවම කිරීමට අප දැනටමත් පියවර ගෙන තිබේ. | ඉවත්වයාම් කළමනාකරණය කිරීමට පියවරක් ගත යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 43,956 ක් වටිනා භෞතිකව තහවුරු කළ ටී ෂර්ට් තොගයක් | පිළිතුරු ලබා දී නොමැත. | ඒවා බෙදා හැරීමට කටයුතු කළ යුතුයි. |

වර්ෂ 5 කට වැඩි කාලයක් සිසුන් අතර බෙදා හැරීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන විද්‍යායතනයේ ගබඩාවල නිෂ්ක්‍රීයව තබා තිබූ අතර එම තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇත.

**3.3 වාහන ඇණිය කළමනාකරණය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ විද්‍යායතනයේ බද්දට ගෙන ඇති වාහන දෙකක් ඉන්ධන පරිභෝජනය සඳහා භාර නිලධාරියාගේ අනුමැතිය ලබා නොගෙන සහ ගමන් කිරීම සඳහා රියදුරන්ගේ අත්සන් නොමැතිව දළ වශයෙන් කිලෝමීටර් 7,037 ක් පමණ ගමන් කර ඇත. | ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. | වාහන පාලනයට නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ආ) | විද්‍යායතනයේ ඉගැන්වීම් උපකරණ ලෙස 2014 වසරේදී ට්‍රැක්ටරයක් සහ ලෑන්ඩ්මාස්ටර් යන්ත්‍රයක් මිලදී ගෙන ඇති අතර, නමුත් ඒවා මෝටර් රථ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරවා ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අපි ඔබගේ නිරීක්ෂණය පිළිගෙන හැකි ඉක්මනින් ඒවා වාර්තා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමු. | ඒවා ලියාපදිංචි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව 2016 සිට 2019 දක්වා වර්ෂ සඳහා විද්‍යායතනයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2015, 2016, 2017 සහ 2018 වසර සඳහා වාර්ෂික වාර්තා සකස් කර අපගේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එම වාර්තා සිංහලට පරිවර්තනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 4.2 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විද්‍යායතනය විසින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අපි ඔබගේ නිර්දේශය පිළිගෙන අපගේ අමාත්‍යාංශයට සහ UNIVOTEC වෙත සාමාජිකයෙකු නම් කරන ලෙස ඉල්ලා සිටිමු. අපගේ ප්‍රධාන ආයතනයෙන් අපට සාමාජිකත්වය ලබා දී ඇත. විගණන කමිටුවක් පිහිටුවීමට අපි වහාම කටයුතු කරනු ලැබේ. | විගණන කමිටුවක් පිහිටුවීමට කටයුතු කළ යුතුයි. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය සහ තථ්‍ය වියදම් අතර ප්‍රතිශත 14 සිට 100 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර, එමගින් පෙන්නුම් කරන්නේ අයවැය කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස භාවිත කර නොමැති බවයි. | භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් අපට ලබා දී ඇති රජයේ මුදල් නාස්ති නොකරමු. අයවැයෙන් ඔබ්බට කිසිදු වියදමක් නොකර අප විසින් ඉතිරි කිරීම් සිදු කර ඇත. | අයවැය ඇස්තමේන්තු සකස් කර නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුයි. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සෑම රාජ්‍ය ආයතනයක්ම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කළ යුතු අතර 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත 2017 ඔක්තෝම්බර් 03 දින සම්මත කර ගැනීමෙන් පසු සියලුම රාජ්‍ය ආයතන චක්‍රලේඛ මගින් ඉහත කරුණ පිළිබඳව දැනුවත් කර තිබුණි. කෙසේ වෙතත්, විද්‍යායතනය එහි ක්‍රියාකාරීත්වයට අදාළ අරමුණු හා ඉලක්ක සහ එම ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය දර්ශක හඳුනාගෙන නොතිබුණි. | 2017 ඔක්තෝබර් 03 වැනි දින 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ චක්‍රලේඛය භාවිතා කරමින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගත යුතුයි. |